# නෝර්ත්සී ලිමිටඩ්

(ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමාගමකි)

## පුරප්පාඩු

**පහත දැක්වෙන තනතුර සඳහා**
**යෝග්‍යතාපූර්ණ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ**

## සාමාන්‍යාධිකාරී

### (අ) සුදුසුකම් හා පළපුරුද්ද

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව/ කළමනාකරණය/ මානව සම්පත් යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters උපාධියක්) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් ලත්. කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**හෝ**

02. තනතුරට අදාළ ක්ෂේත්‍රයක (ගිණුම්/ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව) පිළිබඳ පිළිගත් වෘත්තියවේදී වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ මට්ටමේ"** අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

### (ආ) වැටුප් පරිමාණය :

HM 1-3-86,865-15X2,270-120,915/-

මූලික වැටුප (රු. 86,865/-) - HM 1-3 තත්ත්වය සහ ඉන්ධන දීමනාව සහ නිල වාහන පහසුකම් හෝ රු. 50,000/- ක ප්‍රවාහන දීමනාව මාසිකව හිමිවන අතර, අනුමත කර ඇති වෙනත් දීමනාද හිමිවේ.

### (ඇ) වයස

වයස **අවුරුදු 35 ට** නොඅඩු සහ **අවුරුදු 55 ට** නොවැඩි විය යුතුය.

**පත්වීම්වල ස්වභාවය :**

ඉහත තනතුර ස්ථිර පදනම මත වන අතර, EPF සහ ETF අරමුදල්වලට හිමිකාරිත්වය සහිතව, වසර තුනක (03) පරිවාස කාලසීමාවකට යටත් වනු ඇත.

### පොදු කොන්දේසි :

- සෑම අයදුම්කරුවකුම, තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටුකිරීමට හැකිවන සේ මනා කායික හා මානසික සුවතාවයකින් හා යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු වන අතර, අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත විය යුතුය.
- රජයේ දෙපාර්තමේන්තු/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් විසින් සිය සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (CV) සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විමසුම් විස්තර ද සමග තමන්ගේ අධ්‍යාපනික/ වෘත්තියවේදී සුදුසුකම් හා පෙර වැඩ පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් ද සමග ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරමින් පහත ලිපිනයට **2022 මාර්තු මස 25 වන දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**නෝර්ත්සී ලිමිටඩ්,**
**අංක 450, D.R. විජයවර්ධන මාවත,**
**කොළඹ 10.**